# හොරණ රාජමහ විහාරයේ බිතු සිතුවම්

මද්දුමාගේ හිමාෂා හංසනි

සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
hansanimaddumage@gmail.com

---

මෙම පර්යේෂණයේ අරමුණ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ප්‍රධාන නගරයක් වන හොරණ නගරයේ පිහිටි හොරණ රාජමහ විහාරයේ සිතුවම් සහ ඒවායෙහි වර්ණ භාවිතය පිළිබඳව විමසා බැලීම ය. ඒ සඳහා මෙම විහාරයේ ප්‍රතිමාගෘහ සිතුවම් අධ්‍යයනය කළ අතර විහාරයේ ඉතිහාසය පිළිබඳව ලිඛිත මූලාශ්‍ර මගින් අනාවරණය කරගැනිණි. විහාර මන්දිරය හා පිටත මාලය යන අංග දෙකෙහි ම සිතුවම් අනාවරණය වූ අතර විහාර මන්දිරයේ බිත්ති හතරෙහි ම සිතුවම් දැකගත හැකි විය. පතේළ තුනකට බෙදා ඇති සෑම බිත්තියක් ම රතු පැහැ පසුබිමකින් යුක්ත ය. මානවරූප නිර්මාණය කිරීමේ දී ඉදිරියට යොමු වූ සිරුරත් පැත්තට යොමු වූ දෙපාත් හේතුවෙන් පාර්ශව දර්ශී රීතියට අනුගත ය. ශ්‍රාවකයන් වහන්සේලා, සත්සතිය මෙන් ම ශක්‍ර, බඹ වැනි දෙවිවරුත් විශේෂයෙන් ම නාග හිසක් හා මිනිස් සිරුරකින් හෙබි රාහු අසුරයා ද වස්තු විෂයයන් අතර වේ. සිතුවම් පසුබිමෙහි මල් බඳුන්, ජනෙල් රෙදි, ස්වභාවික ගස් ආදිය දැකගත හැකි ය. සිවිලිම් තලය නෙළුම් මල් මෝස්තරයන්ගෙන් විචිත්‍ර විය. පිටත මාලයේ දී සිවිලිම් තලය තුළ පහතරට සම්ප්‍රදායට නැඹුරු වූ මල් මෝස්තර රැසකි. එහි ම බිත්තිවල මෑතකාලීනව එකතු වූ සිතුවම් පෙලෙකි. භාවිත වූ වර්ණ අතර රතු, කහ, කොළ, සුදු සහ කළු මෙන් ම පිටත මාලයේ සිවිලිමෙන් රෝස වැනි වර්ණයන් හමු විය. ඉහත කී ලක්ෂණයන් හා විදේශීය බලපෑමෙන් පසුව ඉදිවීම හේතුවෙන් හොරණ රාජමහ විහාරයේ සිතුවම් මහනුවර යුගයේ පහතරට සම්ප්‍රදායේ මිශ්‍ර ලක්ෂණ දරන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද : හොරණ රාජමහ විහාරය, ප්‍රතිමාගෘහ සිතුවම්, පහතරට සම්ප්‍රදාය